# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2273/33 – 2022 මාර්තු 29 වැනි අඟහරුවාදා – 2022.03.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මගේ යොමු අංකය: 2014/TC/පොදු.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: DS/TG/LND/CCASE/05/51(2).

ත්‍රිකුණාමලය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වෙල්ලයිමනල් ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, පිහිටා ඇති මාබල් බීච් නැමති ඉඩම අත්කර ගැනීමට අදාලව අ.ග.පි.287 ඉඩම් කැබැල්ල සඳහා ගොනුකර තිබූ CA(Writ)129/2017 නඩුවේ නඩු තීන්දුවට අනුව 1978.05.19 දිනැති *ගැසට් පත්‍රයෙන්* ප්‍රකාශයට පත් ඉඩම් අත්කරගැනීම පනතේ 7 වගන්තිය පදනම්කරගෙන හිමිකම් පරීක්ෂණය සිදුකර අදාල ඉඩම් හිමිකරුවන් වෙත වන්දි ගෙවීමට කටයුතු කරනමෙන් නියෝග කර ඇත.

එබැවින් එයට අදාලව ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා 1972 අංක 18 හා 1974 අංක 29 දරන අර්ථ නිරූපණ (සංශෝධිත) පණත්වලින් සංශෝධිත අර්ථ නිරූපන අඥාපනතේ (12 වන අධිකාරය) 18 වගන්තිය ප්‍රකාරව ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම අංක 1924/40 හා 2015.07.23 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* 2A පිටුවේ අංක CR/1262/2/60/4176 හා 1975.12.05 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර "ඒ" හා "බී" ලෙස සඳහන් ප්‍රමාණයෙන් හෙක්.14.4405 ක් සඳහා පළ කරන ලද 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය මෙයින් අවලංගු කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

2022 මාර්තු මස 24 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 03 - 1051


1A – G 036496 – 20 (2022/03)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*